# ආරක්ෂක අමාත්‍යාංශය

# பாதுகாப்பு அமைச்சு

# MINISTRY OF DEFENCE

# දැක්ම

“සෑම සුරැකි සුවබර රටක්”

# මෙහෙවර

“භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත ස්වෛරී රටක්, තිරසාර නාගරික පරිසරයක්, තරඟකාරී ආර්ථිකයක් සහ උසස් ජීවන තත්වයක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම”

# අපගේ මෙහෙවර

**අපගේ සේවා දායක**

**අභිමතාර්ථ**

**අනලස්ව ඉටු කරමින්**

**වඩාත් කාර්යක්ෂම වූත්**

**නිවැරදි වූත්**

**සුහදශීලි සේවයක් ලබා දීම.**

**සිවිල් ආරක්ෂක අංශය.**

# රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

## 6 වන මහල

i. සිවිල් ආරක්ෂක අංශය.
ii. සංවර්ධන අංශය.
iii. අභ්‍යන්තර විගණන අංශය.
iv. සන්නද්ධ අංශය.

## 7 වන මහල

i. සිවිල් ආරක්ෂක අංශය.
ii. නීති අංශය.
iii. රජයේ විගණන අංශය.

# <u>සිවිල් ආරක්ෂක අංශයේ සේවාවන්.</u>

1. ගිනි අවි සම්බන්ධ සේවාවන්.
    i. ගිනි අවි නිකුත් කිරීම.
    ii. ගිනි අවි සම්බන්ධ වෙනත් කටයුතු.
2. පුපුරන ද්‍රව්‍ය සම්බන්ධ සේවාවන්.
3. පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍ය ආයතන ලියාපදිංචි කිරීම.
4. අන්තරායකර නැව් නිශ්කාෂණය සඳහා අවසරපත් නිකුත් කිරීම.
5. මුහුදු ආරක්ෂණ සේවාවන් සැපයීම.
6. විදේශීය ප්‍රභූන්ගේ ආරක්ෂක නිළධාරීන් විසින් මෙරටට ගෙන එනු ලබන ගිනිඅවි සඳහා අවසර ලබා දීම.
7. වාහන පැති වීදුරු අඳුරු කිරීමට අවසර ලබා දීම.
8. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව.

# ගිනි අවි සම්බන්ධව රාජකාරි කටයුතු.
# 1916 අංක 33 දරණ ආඥා පනත.

## 1) ගිනි අවි නිකුත් කිරීම.

i. ජීවිත ආරක්ෂාව සඳහා ගිනි අවි ලබා දීම.
ii. දේපල ආරක්ෂාව සඳහා ගිනි අවි ලබා දීම.
iii. වගා ආරක්ෂාව හා සත්ව පාලනය සඳහා ගිනි අවි ලබා දීම.
iv. ක්‍රීඩා කටයුතු සඳහා ගිනි අවි ලබා දීම.
v. රාජ්‍ය/ පෞද්ගලික ආයතන සඳහා ගිනි අවි නිකුත් කිරීම.
vi. පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන වෙත ගිනි අවි නිකුත් කිරීම.
vii. පොල් වගා ආරක්ෂාව සඳහා ගිනි අවි ලබා දීම.
viii. වල් අලි පලවා හැරීම සඳහා ගිනි අවි ලබා දීම.
ix. වගා ආරක්ෂාව සඳහා රජය සතු ගිනි අවි තාවකාලිකව ලබා දීම.
x. ගිනි අවි පැවරීම.

## 2) <u>ගිනි අවි සම්බන්ධ වෙනත් කටයුතු.</u>

i. රජය සතු ගිනි අවි සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
ii. ගිනි අවි භාවිතය සඳහා මුරකරු අවසරපත්‍ර ලබා දීම.
iii. ගිනි අවි අළුත්වැඩියා කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම.
iv. වායු තුවක්කු, වායු රයිෆල්, නිර්වින්ධන තුවක්කු ආනයනය කිරීම හා රේගු භාරයෙන් නිදහස් කිරීමට අවසර ලබා දීම.
v. Pain Balls guns and dry gun ආනයනයට අවසර ලබා දීම.
vi. ගිනි අවි විකිණීමට අවසර ලබා දීම.
vii. ක්‍රීඩා කටයුතු සඳහා ගිනි අවි මෙරටින් බැහැරට ගෙන යාමට අවසර ලබා දීම.
viii. ගිනි අවි රජයට භාරගැනීමට හා රජයට භාරදුන් ගිනි අවි නැවත ලබා දීම.
ix. නැති වූ ගිනි අවි බලපත්‍ර හා වැරදි ලෙස ගිනි අවි අංක සටහන් වූ ගිනි අවි බලපත්‍ර වෙනුවට අළුතින් බලපත්‍ර නිකුත් කිරීම.
x. භාවිතයට නුසුදුසු ගිනි අවි රජයට භාර දී නව ගිවි අවි ලබා ගැනීම.
xi. ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම (නිසි කාලය තුල අළුත් නොකර ගන්නා ලද බලපත්‍ර සඳහා)
xii. වයස අවුරුදු 66 ඉක්මවූ පුද්ගලයින් සඳහා ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම.
xiii. ගිනි අවි බලපත්‍ර අධිකාරිත්වය වෙනස් කිරිම.
xiv. කෞතුක භාණ්ඩයක් වශයෙන් ගිනි අවි ළඟ තබා ගැනීමට අවසර ලබා දීම.
xv. සොරකම් කල ගිනි අවි වෙනුවට නව ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම.

## <u>පුපුරන ද්‍රව්‍ය (1956 අංක 21 දරණ ආඥා පනත).</u>

i. පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම.
ii. පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම.
iii. පුපුරන ද්‍රව්‍ය සපයන්නන් ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම.
iv. පුපුරන ද්‍රව්‍ය නිශ්පාදන බලපත්‍ර නිකුත් කිරීම.
v. බලපත්‍ර සහිත ගිනි අවි සඳහා පතරොම් මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම.
vi. පුපුරන ද්‍රව්‍ය අලෙවි නියෝජිතයන් හට පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම.
vii. ගිණිකෙළි නිශ්පාදන සඳහා පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම.
viii. ගිණිපෙට්ටි නිශ්පාදන සඳහා පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම.
ix. CEFAP ආයතනයේ ආනයනික පුපුරන ද්‍රව්‍ය සඳහා නිෂ්කාශණ කටයුතු අවසර පත්‍ර නිකුත් කිරීම.
x. රාජ්‍ය ආයතන, ජාතික ව්‍යාපෘති සඳහා මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම.
xi. මල් වෙඩි සංදර්ශන පැවැත්විම සඳහා අවසර ලබාදීම.

# <u>පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍ය ආයතන ලියාපදිංචි කිරීම.</u>

(1998 අංක 45 දරණ පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍ය ආයතන විධිමත් කිරිමේ පනත.)

I. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතන ලියාපදිංචිය හා බලපත්‍ර නිකුත් කිරීම.
II. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවල නිල ඇඳුම් සම්බන්ධව කමිටු වාර්තා නිකුත්කිරිම.
III. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවලට විරුද්ධව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධව කටයුතු.
IV. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවලට ගිනි අවි නිකුත් කිරීම.
V. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවල නිලධාරීන්ට ගිනි අවි පුහුණුව ලබාදීම, ඒ සඳහා වෙඩි පිටි වෙන්කිරිම හා ඊට අවශ්‍ය ගිනි අවි ප්‍රවාහනයට අවසර ලබාදීම.

# අන්තරායකාරි පුපුරන ද්‍රව්‍ය සහිත නැව් නිශ්කාෂණ කටයුතු.

(1956 අංක 21 දරණ ආඥා පනත)

I. පුපුරන ද්‍රව්‍ය රැගත් අන්තරායකාරි නැව් / ගුවන් බඩු මාර්ගස්ථ කිරීම, ගොඩ බෑම සහ නිශ්කාෂණය කිරිම සදහා අවසර පත්‍ර නිකුත් කිරීම.

II. පුපුරණ ද්‍රව්‍ය ආනයනය සඳහා "ආනයන පාලක" වෙත අවසර ලිපි නිකුත් කිරීම.

## අන්තරායකාරි පුපුරන ද්‍රව්‍ය සහිත නැව් නිශ්කාෂණ කටයුතු සඳහා **ඉදිරිපත් කල යුතු ලේඛන** :

A. **ද්විත්ව පිටපතකින් යුත් ඉල්ලීම් ලිපිය.**

B. **ආනයන බලපත්‍රයේ මුල් පිටපත.**

C. **පූර්වීය භාණ්ඩ ලේඛනයේ ඡායා පිටපතක් (Performa Invoice.)**

D. **Bill of Loading ලේඛනයේ ඡායා පිටපතක්.**

E. **D.G. Declaration Sheet ලේඛනයේ ඡායා පිටපතක්.**

# <u>අඳුරු වීදුරු භාවිතය සඳහා අදාල කටයුතු.</u>

(අංක 1273/28 දරණ අති විශේෂ ගැසට් පත්‍රය)

❖ වාහනවල පැති වීදුරු අඳුරු කිරීම සඳහා අවසර ලබාදීම.

**<u>ඉදිරිපත් කල යුතු ලේඛන</u>** :

I. **ඉල්ලීම් ලිපිය.**

II. **වාහනවල පැති වීදුරු අඳුරු කිරීම අවශ්‍ය වන්නේ,**

A. වෛද්‍ය හේතුන් මත නම්,
   a. අදාල වෛද්‍ය වාර්ථා.
   b. ප්‍රධාන වෛද්‍ය නිළධාරිවරයකුගේ නිර්දේශය.

B. ජීවිත ආරක්ෂාව සඳහා නම්,
   a. පොලිස් වාර්ථා.
   b. අදායම් බදු පිළිබද විස්තර.

C. ඖෂධ / අහාර වර්ග ප්‍රවාහනය සදහා නම් ව්‍යාපාර ලියාපදිංචි කිරිමේ සහතික.

D. මුදල් ප්‍රවාහනය කිරීමට නම්,
   a. ව්‍යාපාර ලියාපදිංචි කිරිමේ සහතික.
   b. මුදල් ප්‍රවාහනය කිරිමට අදාල ලියවිලි.

E. රජයේ නිළධාරින් / වෘත්තිකයන් සදහා නම්,
   a. පත්වීමේ ලිපිය / ගැසට් නිවේදනය.
   b. සේවා ලිපිය.

III. අදාල **වාහන බලපත්‍රයේ ඡායා පිටපතක්.**

## තුවක්කු ආඥා පනතේ 15 වැනි වගන්තියට අනුව ගිනිඅවි පැවරීමක් සඳහා ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන.

("දේපල ආරක්ෂාව" වෙනුවෙන් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිනිඅවියක් සඳහා)

ගිනිඅවියක් පවරනු ලබන්නේ ගිනිඅවි හිමිකරුගේ පවුලේ සාමාජිකයන් වෙත පමණය. පවුලේ සාමාජිකයන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ ස්වාමිපුරුෂයා, බිරිඳ, පුතා/දුව හෝ ඔවුන් හා විවාහ වී ඇති කලත්‍රයන් පමණි.

1. සම්පූර්ණ කරන ලද ගිනිඅවි පැවරීමේ ඉල්ලුම්පත හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්.
2. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්.
3. ඥාතීත්වය තහවුරු කිරීම සඳහා අදාල පරිදි උප්පැන්න සහතිකයේ/විවාහ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්.
4. ගිනිඅවි පැවරුම්ලාභියාට අයත් ව්‍යාපාර (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික, බදු ගෙවීමේ විස්තර, බැංකු ප්‍රකාශන)
5. අදාල ව්‍යාපාර ඇතුලත් විස්තර ගිනි අවි පැවරුම්කරුට පවරා නොමැති නම් එම දේපල ඉදිරි කාලයේදී පැවරුම්ලාභියා
   වෙත පවරා දෙන බවට එම හිමිකරු විසින් දිවුරා ප්‍රකාශ කරන ලද දිවුරුම් ප්‍රකාශය සමග එම ව්‍යාපාර සඳහා වූ සහතික කරන ලද ඡායා පිටපත්
6. පැවරුම්ලාභියා හැර වෙනත් දරුවන් සිටී නම් ව්‍යාපාර පැවරුම්ලාභියාට ලබාදීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත දක්වන දිවුරුම් ප්‍රකාශය.
7. ව්‍යාපාර සඳහා ගැමි තර්ජන තිබේ නම් ඊට අදාල පොලිස් වාර්තා
8. පැවරුම්ලාභියා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සාමාජිකයෙකු නම්, ගිනිඅවිය පැවරීම පිළිබඳව සේවය කරන ආයතනයේ ප්‍රධානියාගෙන් ලබාගත් එකඟතා ලිපියක්.
9. පවරනු ලබන ගිනිඅවියට අවසන් වරට ලබාගත් වාර්ෂික බලපත්‍රයේ ඡායා පිටපතක්.
10. ගිනිඅවි හිමිකරු මියගොස් ඇත්නම් ඔහුගේ / ඇයගේ මරණ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්.
11. දිවුරුම් ප්‍රකාශ අදාල කරුණු සනාථ වන පරිදි නිවැරදි ආකාරයට ලියා තිබිය යුතු අතර, නියමිත ගාස්තු ප්‍රමාණයට මුද්දර යොදා අත්සන් කර තිබිය යුතුය. එමෙන්ම තමා දිවුරුම ඉදිරිපත් කරනු ලබන සාමදාන විනිශ්චයකරු හෝ දිවුරුම් කොමසාරිස් කවුරුන්ද යන්න පැහැදිලිව සඳහන් වන පරිදි ඔහුගේ නිල මුද්‍රාව තබා ඔහු විසින් නියමිත ස්ථානයේ අත්සන් කර තිබිය යුතු වේ.

## තුවක්කු ආඥා පනතේ 15 වැනි වගන්තියට අනුව
## ගිනිඅවි පැවරීමක් සඳහා ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන.

**("කෘෂිකාර්මික කාර්යයක්" වෙනුවෙන් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිනිඅවියක් සඳහා)**

ගිනිඅවියක් පවරනු ලබන්නේ ගිනිඅවි හිමිකරුගේ පවුලේ සාමාජිකයන් වෙත පමණය. පවුලේ සාමාජිකයන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ ස්වාමිපුරුෂයා, බිරිඳ, පුතා/දුව හෝ ඔවුන් හා විවාහ වී ඇති කලත්‍රයන් පමණි.

1. සම්පූර්ණ කරන ලද ගිනිඅවි පැවරීමේ ඉල්ලුම්පත.
2. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්.
3. ඥාතීත්වය තහවුරු කිරීම සඳහා අදාල පරිදි උප්පැන්න සහතිකයේ/විවාහ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්.
4. කෘෂිකාර්මික ඉඩකඩම් ගිනිඅවි පැවරුම්ලාභියාට නීත්‍යානුකූලව පැවරූ ඔප්පුවල සහතික කරන ලද ඡායා පිටපත්.
5. කෘෂිකාර්මික ඉඩකඩම් ඔප්පු මගින් පවරා නොමැති නම් එම ඉඩකඩම් ඉදිරි කාලයේදී පැවරුම්ලාභියා වෙත පවරා දෙන බවට එම ඉඩම් හිමිකරු විසින් දිවුරා ප්‍රකාශ කරන ලද දිවුරුම් ප්‍රකාශය සමග එම ඉඩකඩම් සඳහා වූ ඔප්පු වල සහතික කරන ලද ඡායා පිටපත් (දිවුරුම් ප්‍රකාශයේ එම ඔප්පු අංකයන් හා ඊට අදාල භූමි ප්‍රමාණයන් (අක්කර, රූඩ්, පර්චස් වශයෙන්) සඳහන් කර තිබිය යුතුය.
6. පැවරුම්ලාභියා හැර වෙනත් දරුවන් සිටී නම් වගා ඉඩම් පැවරුම්ලාභියාට ලබාදීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත දක්වන දිවුරුම් ප්‍රකාශය.
7. ඉහත 3 හා 4 ඡේදය අනුව ඉදිරිපත් කරන ඔප්පුවලට අයත් ඉඩම් වල ඇති වගාවන් මොනවාද?, ඒවා කොපමණ ප්‍රමාණයකින් යුක්තද?, එම වගාවන්ට සිදුවන හානි පිළිබඳව කරුණු ඇතුළත් අදාල ක්ෂේත්‍රයේ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරියෙකු වෙතින් ලබාගත් සහතිකයක්.
8. පැවරුම්ලාභියා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සාමාජිකයෙකු නම්, ගිනිඅවිය පැවරීම පිළිබඳව සේවය කරන ආයතනයේ ප්‍රධානියාගෙන් ලබාගත් එකඟතා ලිපියක්.
9. පවරනු ලබන ගිනිඅවියට අවසන් වරට ලබාගත් වාර්ෂික බලපත්‍රයේ ඡායා පිටපතක්.
10. ගිනිඅවි හිමිකරු මියගොස් ඇත්නම් ඔහුගේ/ ඇයගේ මරණ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්.
11. දිවුරුම් ප්‍රකාශ අදාල කරුණු සනාථ වන පරිදි නිවැරදි ආකාරයට ලියා තිබිය යුතු අතර, නියමිත ගාස්තු ප්‍රමාණයට මුද්දර යොදා අත්සන් කර තිබිය යුතුය. එමෙන්ම තමා දිවුරුම ඉදිරිපත් කරනු ලබන සාමදාන විනිශ්චයකරු හෝ දිවුරුම් කොමසාරිස් කවුරුන්ද යන්න පැහැදිලිව සඳහන් වන පරිදි ඔහුගේ නිල මුද්‍රාව තබා ඔහු විසින් නියමිත ස්ථානයේ අත්සන් කර තිබිය යුතු වේ.

# තුවක්කු ආඥා පනතේ 22 වැනි වගන්තියට අනුව තුවක්කුවක් සන්තකයේ තබාගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන.

(**"කෘෂිකාර්මික කාර්යයක්"** වෙනුවෙන් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිනිඅවියක් සඳහා)

1. සම්පූර්ණ කරන ලද ගිනිඅවි / තුවක්කු ඉල්ලුම්පත.
2. ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත.
3. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයේ මුල් පිටපත.
4. ගිනිඅවිය / තුවක්කුව අයදුම් කරන්නේ;
    - ගොවිතැන/වගාව සම්බන්ධව නම්,
      ඉඩමේ වගා කර ඇති බව සහ වගා හානිය පිළිබඳව ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ වාර්තාවේ මුල් පිටපත.
    - සත්ත්ව පාලනය සඳහා නම්,
      සත්ත්ව ගොවිපළ පිළිබඳව පශු වෛද්‍ය නිළධාරි වාර්තාවේ මුල් පිටපත.
5. ඉඩම්....
    - ඉදිරිපත් කරන ලද ඉඩම් ඔප්පු වල සහතික කරන ලද පිටපත්.
    - බදු ඉඩමක් නම් ගිනි අවිය ලබාදීම පිළිබඳ විරෝධතාවයක් නොමැති බවට ඉඩම් හිමිකරුවන්ගෙන් ලබාගත් සහතිකයේ මුල් පිටපත.
    - වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි ඉඩමක් නම් අදාල දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිත ලිපියක මුල් පිටපත.
    - කලත්‍රයා සතු ඉඩම් ඉදිරිපත් කරන්නේ නම්, විවාහ සහතිකයේ සහතික කළ පිටපත.

# ජීවිත ආරක්ෂාව සඳහා ගිනි අවියක් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට ඉදිරිපත් කල යුතු ලේඛන.

## 01. සිවිල් පුරවැසියන්

i. ජාතික හැඳුනුම්පත.
ii. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
iii. දේපල පිළිබඳ හෝ ජීවිත තර්ජන පිළිබඳ පොලිස් වාර්තා.
iv. ආදායම් බදු වාර්තා. (පසු ගිය වසර 3 ක)
v. බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු.
vi. වත්කම් පිළිබඳ විස්තර.

## 02. රාජ්‍ය නිලධාරීන්, වෘත්තිකයන්, දේශපාලකයන්

i. පත්වීමේ ලිපියේ පිටපතක්.
ii. ගැසට් නිවේදනයේ පිටපතක්.
iii. රාජකාරි හැඳුනුම්පත.
iv. වත්කම් පිළිබඳ විස්තර.
v. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය.
vi. ආදායම් බදු විස්තර.

# <u>පලමු වරට පෞද්ගලික ආරක්ෂක ආයතනයක් ලියාපදිංචි කිරීමේ දි අවශ්‍ය වන ලේඛන.</u>

1. අයදුම් පත්‍රය සමග සී/ස සමාගමක් වශයෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
    - සාංසමික ව්‍යවස්ථාවලිය
    - අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන
2. අධ්‍යක්ෂ මණ්ඩලයේ පොලිස් නිශ්කාශණ වාර්තා. (කොට්ඨාශ භාර පොලිස් අධිකාරි සහතික කරන ලද)
3. ආරක්ෂක කළමණාකරුගේ පොලිස් වාර්තා. (කොට්ඨාශ භාර පොලිස් අධිකාරි සහතික කරන ලද)
4. ආරක්ෂක කළමණාකරුගේ සේවා සහතිකය.
5. පහත ආයතන වල ලියාපදිංචිය.
    - සේවක අර්ථසාධක අරමුදල.
    - සේවා භාරකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය.
6. ඉල්ලීම් ලිපිය.
7. අමාත්‍යාංශ අධ්‍යනයට වෙනත් ලේඛන.

# පෞද්ගලික ආරක්ෂක ආයතනයක ලියාපදිංචිය අලුත් කිරීම.

1. අයදුම් පත්‍රය සමග සී/ස සමාගමක් වශයෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
    - **සාංසමික ව්‍යවස්ථාවලිය**
    - **අධ්‍යක්ෂ මණ්ඩල ලේඛණ**
2. **අධ්‍යක්ෂ මණ්ඩලයේ පොලිස් නිශ්කාශණ වාර්තා. (කොට්ඨාශ භාර පොලිස් අධිකාරි සහතික කරන ලද)**
3. **ආරක්ෂක කළමණාකරුගේ පොලිස් වාර්තා. (කොට්ඨාශ භාර පොලිස් අධිකාරි සහතික කරන ලද)**
4. **ආරක්ෂක කළමණාකරුගේ සේවා සහතිකය.**

5. පසුගිය වර්ෂ දෙක සඳහා
    - ආදායම් බදු ගෙවීම්.
    - සේවක අර්ථ සාධක ගෙවීම්.
    - සේවක භාරකාර අරමුදලේ ගෙවීම්.
    - දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ පිළිබඳ වර්ගසේවා දායක ලේඛන.
6. සේවාදායක ලේඛන.
7. සේවකයින්ගේ තොරතුරු.
8. ඉල්ලීම් ලිපිය.
9. අමාත්‍යාංශයට අවශ්‍ය වෙනත් ලේඛන.

## රාජ්‍ය ආයතන වල ගිනි අවි නිකුත් කිරීම.

1. අදාල ආයතනයේ ප්‍රධානීන්ගේ ඉල්ලීම් ලිපිය.
2. ගිනි අවි අවශ්‍යතා සනාථ කරන වෙනත් ලේඛන.
3. ආයතන සන්තකයේ පවතින ගිනි අවි වර්ග.

## විදේශ ප්‍රභූන් ගිනි අවි රැගෙන ඒමේදී

1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය.
2. අදාල රටේ තානාපති කාර්යාලයේ ඉල්ලීම.
3. වෙනත් ලේඛන.

# පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලේඛන.

1. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර
    i. ගල් පිපිරවීම/කැණීම් කාර්යන් සඳහා - (1) ආකෘතිය.
    ii. පුපුරන ද්‍රව්‍ය බලපත්‍රය/ අවසරපත්‍රයක් සඳහා - (2) ආකෘතිය.
    iii. ගල් පිපිරවීම/ කැණීම් ඉල්ලීම් සඳහා - (3) ආකෘතිය.
    iv. පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර/ පූර්ව/ ආවරණ අනුමැතිය සඳහා - (4) ආකෘතිය.
2. අයදුම්කරුගේ චරිතය පිලිබඳ පොලිස් වාර්තාව.
3. ගල් පිපිරවීම/ කැණීම් කරන ස්ථානයේ අයිතිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී/ බීට්ටු වන නිලධාරි/ ඒකක කළමණාකරු වාර්තාව/ සමග ප්‍රාදේශීය ලේකම්/ දිසා වන නිලධාරි නේවාසික ව්‍යාපාර කළමණාකරුගේ නිර්දේශය.
4. ගල් පිපිරවීම/ කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව. (3 ආකෘතිය)
5. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබා ගත් කැණීම් බලපත්‍රය/ වාර්තාව.
6. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් ශාඛා කාර්යාලයකින්, පිපිරවීම/ කැණීම් කරන ස්ථානය අයත් පලාත් පාලන ආයතනයකින් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය.
7. ගල් පිපිරවීම/ කැණීම් කරන ස්ථානය අයත් පලාත් පාලන ආයතනයෙන් ලබා ගත් වෙළඳ බලපත්‍රය.
8. රජයේ සංවර්ධන කටයුතු සඳහා පුපුරන ද්‍රව්‍ය ඉල්ලුම් කිරීමේදි අදාල කොන්ත්‍රාත්තුව අයදුම්කරු නමට ලැබී ඇති බවට සියළුම ලියකියවිලි අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.
9. අයදුම්කරු විදේශිකයෙකු නම්, එම පුද්ගලයාගේ විදේශ ගමන් බලපත්‍රය සහ වීසා සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතක් සමග එවිය යුතුය.

# නිෂ්පාදන බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලේඛන.

(1) සම්පූර්ණ කරන ලද 5 හා 9 ආකෘතිය සමග සකස් කරන ලද (අ) (ආ) (ආ 1) (ඇ) ආකෘති පත්‍රයක්.
(2) පොලිස් වර්ථාව.
(3) සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකගේ නිර්දේශ.
(4) ව්‍යාපාර ලියා පදිංචි කිරීමේ සහතිකය.
(5) බලපත්‍ර ලබාගැනීම සඳහා මුදල් ගෙවීම් කරන ලද කුවිතාන්සිය.
(6) පෙර වර්ෂයට ලබාගත් නිෂ්පදන බලපත්‍රය.

ගල්වෙඩි බෙහෙත් හා ආරක්ෂක සේවා නුල් නිෂ්පදනය සඳහා පහත ලිපි ඉදිරිපත් කල යුතුය.

(1) පාරිසරික ආරක්ෂක බලපත්‍රය.
(2) නිෂ්පාදන ප්‍රමිතිය පිළිබඳ රජයේ රස පරීක්ෂක වාර්ථාව.
(3) ප්‍රාදේශිය ලේකම්ගේ වාර්ථාව (9 ආකෘතිය)

# <u>ආනයන බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලේඛන.</u>

(1) සම්පූර්ණ කරන ලද "5" ආකෘතිය පත්‍රය අදාල ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(2) ආනයනය කරණු ලබන පුපුරන ද්‍රව්‍ය වර්ග හා ප්‍රමාණ ඇතුලත් ලේඛනය.

(3) ආනයනය කරණු ලබන පුපුරන ද්‍රව්‍ය ගබඩා කරන පිළිවෙල හා ගබඩා පහසුකම් පිළබඳ විස්තරය.

(4) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය.

(5) ඉල්ලුම්කරුගේ ජා.හැ.ප. / විදේශ ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්.

## සපයන්නා බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලේඛන.

(1) සම්පූර්ණ කරන ලද “5” ආකෘතිය.

(2) වෙළඳ බලපත්‍රය හෝ වෙළඳ නාම ලියාපදිංචි කිරීමේ සහතිකය.

(3) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය

(4) පොලිස් වාර්ථාව.

(5) පසුගිය වර්ෂයේ ලබාගත් සපයන්නා බලපත්‍රයේ පිටපත.

## පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලාභීන්ට පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීමේ අවසර පත්‍රය ලබාගැනිම.

(1) සම්පුර්ණ කරන ලද “6” ආකෘතිය.

(2) සහකාර පුපුරන ද්‍රව්‍ය පාලකගේ නිර්දේශය.

(3) පොලිස් ස්ථානාධිපතිගේ වාර්තාවේ නිර්දේශය.

(4) කලින් ලබාගත් පුපුරන ද්‍රව්‍ය, ප්‍රමාණ, විකුණූ ප්‍රමාණ හා ශේෂය ඇතුලත් තොග ලේඛනයේ ඡායා පිටපතක්. (සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක නිර්දේශ කරන ලද)

(5) පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන අනු නියෝජිත පිළිබඳ තොරතුරු හා ඊට භාවිතා කරන වාහනයේ විස්තර.

# ස්වයංක්‍රීය පිස්තෝල, රිවෝල්වර සඳහා පතරොම් මිලදී ගැනීමේද අවසරපත්‍ර නිකුත් කිරීම.

## ඉදිරිපත් කල යුතු ලේඛණ

1. පහත සඳහන් තොරතුරු ඇතුලත් පතරොම් ඉල්ලුම් කිරීමේ ලිපියක් ආරක්ෂක ලේකම් අමතා ගිනි අවියේ අයිතිකරු විසින් ඉදිරිපත් කල යුතුය.
   1. ගිනි අවියේ වර්ගය, අංකය හා ගිනි අවි බලපත්‍රයේ අංකය.
   2. තමාට ආසන්නම පොලිස් ස්ථානය හා තමන් අයත් පොලිස් කොට්ඨාශය.
   3. මීට ඉහතදි ලබා ගත් පතරොම් ප්‍රමාණය වැය වූ අකාරය පිළිබඳ විස්තරය.
2. ගිනි අවි බලපත්‍රයේ මුල් පිටපත පරීක්ෂා කිරීම සඳහා රැගෙන ආ යුතු අතර එහි පිටපතක් අමාත්‍යාංශය වෙත භාර දිය යුතුය.
3. අවසන් වරට තමන් වෙත නිකුත් කරන ලද පතරොම් මිලදි ගැනීමේ අවසරපත්‍ර මුල් පිටපත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කල යුතු අතර එහි පිටපතක් භාරදිය යුතුය.
4. ගිනි අවි හිමිකරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්.

* අයදුම් පත්‍රය සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීම අනුමත වුවහොත් රු.100 ක අවසරපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය.

## සේවාවන් ලබාගැනිමට ගතවන කාලය.


| | සේවාවන් | කාලය |
|---|---|---|
| 01 | ජීවිත ආරක්ෂාව සඳහා ගිනි අවි ලබා දීම. | මාස 01 |
| 02 | දේපල ආරක්ෂාව සඳහා ගිනි අවි ලබා දීම. | මාස 01 |
| 03 | වගා ආරක්ෂාව හා සත්ව පාලනය සඳහා ගිනි අවි ලබා දීම. | මාස 01 |
| 04 | ක්‍රීඩා කටයුතු සඳහා ගිනි අවි ලබා දීම. | මාස 01 |
| 05 | රාජ්‍ය/ පෞද්ගලික ආයතන සඳහා ගිනි අවි නිකුත් කිරීම. | මාස 03 |
| 06 | පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන වෙත ගිනි අවි නිකුත් කිරීම. | මාස 03 |
| 07 | ගිනි අවි පැවරීම. | සති 03 |
| 08 | රජය සතු ගිනි අවි සඳහා බලපත් නිකුත් කිරීම. | පැය 02 |
| 09 | ගිනි අවි භාවිතය සඳහා මුරකරු අවසරපත් ලබා දීම. | පැය 02 |
| 10 | ගිනි අවි අළුත්වැඩියා කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම. | සති 03 |
| 11 | වායු තුවක්කු, වායු රයිෆල්, නිර්වින්දන තුවක්කු ආනයනය කිරීම හා රේගු භාරයෙන් නිදහස් කිරීමට අවසර ලබා දීම. | සති 01 |
| 12 | Pain Balls Guns and Dry Gun ආනයනයට අවසර ලබා දීම. | සති 01 |
| 13 | ගිනි අවි විකිණීමට අවසර ලබා දීම. | පැය 03 |
| 14 | ක්‍රීඩා කටයුතු සඳහා ගිනි අවි මෙරටින් බැහැරට ගෙන යාමට අවසර ලබා දීම. | පැය 04 |
| 15 | ගිනි අවි රජයට භාරගැනීමට හා රජයට භාරදුන් ගිනි අවි නැවත ලබා දීම. | සති 03 |
| 16 | නැති වූ ගිනි අවි බලපත් හා වැරදි ලෙස ගිනි අවි අංක සටහන් වූ ගිනි අවි බලපත්‍ර වෙනුවට අළුතින් බලපත්‍ර නිකුත් කිරීම. | පැය 02 |

| | | |
|---|---|---|
| 17 | භාවිතයට නුසුදුසු ගිනි අවි රජයට භාර දී නව ගිනි අවි ලබා ගැනීම. | සති 01 |
| 18 | ගිනි අවි බලපත් අළුත් කිරීම (නිසි කාලය තුල අළුත් නොකර ගන්නා ලද බලපත් සඳහා) | දින 01 |
| 19 | වයස අවුරුදු 66 ඉක්මවූ පුද්ගලයින් සඳහා ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම. | සති 03 |
| 20 | ගිනි අවි බලපත් අධිකාරිත්වය වෙනස් කිරිම. | සති 03 |
| 21 | කෞතුක භාණ්ඩයක් වශයෙන් ගිනි අවි ලඟ තබා ගැනීමට අවසර ලබා දීම. | පැය 02 |
| 22 | සොරකම් කල ගිනි අවි වෙනුවට නව ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම. | පැය 03 |
| 23 | පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 24 | පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 25 | පුපුරන ද්‍රව්‍ය සපයන්නන් ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 26 | පුපුරන ද්‍රව්‍ය නිශ්පාදන බලපත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 27 | බලපත් සහිත ගිනි අවි සඳහා පතරොම් මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 28 | පුපුරන ද්‍රව්‍ය අලෙවි නියෝජිතයන් හට පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 03 |
| 29 | ගිණිකෙළි නිෂ්පාදන සඳහා පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 03 |
| 30 | ගිණිපෙට්ටි නිෂ්පාදන සඳහා පුපුරන ද්‍රව්‍ය මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 03 |
| 31 | CEFAP ආයතනයේ ආනයනික පුපුරන ද්‍රව්‍ය සඳහා නිෂ්කාශන කටයුතු අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| 32 | රාජ්‍ය ආයතන, ජාතික ව්‍යාපෘති සඳහා මිල දී ගැනිමට අවසර පත්‍ර නිකුත් කිරීම. | පැය 03 |
| 33 | මල්වෙඩි සංදර්ශන පැවැත්වීම සඳහා අවසර ලබාදීම. | පැය 03 |

| | | |
|---|---|---|
| 34 | පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතන ලියාපදිංචිය / බලපත්‍ර නිකුත් කිරීම. | පැය 05 / සති 03 |
| 35 | පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවල නිල ඇඳුම් සම්බන්ධව කමිටු වාර්තා නිකුත්කිරීම. | සති 01 |
| 36 | පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවලට ගිනි අවි නිකුත් කිරීම. | මාස 03 |
| 37 | පෞද්ගලික ආරක්ෂක සේවා සැපයිමේ ආයතනවල නිලධාරීන්ට ගිනි අවි පුහුණුව ලබාදීම, ඒ සඳහා වෙඩි පිටි වෙන්කිරිම හා ඊට අවශ්‍ය ගිනි අවි ප්‍රවාහනයට අවසර ලබාදීම. | පැය 03 |
| 38 | පුපුරන ද්‍රව්‍ය රැගත් අන්තරයකාරි නැව් / ගුවන් බඩු මාර්ගස්ථ කිරිම, ගොඩ බෑම සහ නිෂ්කාශනය කිරිම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම. | දින 01 |
| 39 | පුපුරණ ද්‍රව්‍ය ආනයනය සඳහා “ආනයන පාලක” වෙත අවසර ලිපි නිකුත් කිරීම | දින 01 |
| 40 | වාහනවල පැති වීදුරු අඳුරු කිරීම සඳහා අවසර ලබාදීම. | පැය 02 |
| 41 | ස්වයංක්‍රීය පිස්තෝල, රිවෝල්වර සඳහා පතරොම් මිලදී ගැනීමට අවසරපත්‍ර නිකුත් කිරීම. | පැය 02 |
| | | |

❖ **සියලු සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් බව කාරුණිකව සලකන්න.**

**FRONT VIEW**




**SIDE VIEW**

